# විශේෂ නිවේදනයයි.

ඊශ්‍රායලයේ වාසය කරන සියලුම ශ්‍රී ලාංකික ප්‍රජාව වෙත,

## සීඝ්‍රයෙන් නැවත පැතිරෙන කොරෝනා වෛරසයේ ව්‍යාප්තිය හේතුවෙන් ඊශ්‍රායලය තෙවන වරටත් අගුලු දැමීම (Third Lockdown) සම්බන්ධවයි

කොරෝනා වෛරසයේ ව්‍යාප්තිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් මීට පෙර පල කරන ලද නිවේදනවලට වැඩිමනත් වශයෙනි.

ඔබ සියලු දෙනා දන්නා පරිදි මේ දිනවල ඊශ්‍රායලය තුළ නැවතත් සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන කොරෝනා වෛරස වසංගත තත්වය හේතුවෙන් එම වෛරසය තවදුරටත් ජනතාව අතර පැතිරයාම අවම කිරීම පිණිස ඊශ්‍රායල් රජය විසින් 2020 දෙසැම්බර් 27 වන ඉරිදා ප.ව. 5.00 සිට සති දෙකක කාලයක් ඊශ්‍රායලය තාවකාලිකව අගුලු දැමීමක් (Lockdown) සිදු කරන බව දැනට ප්‍රකාශයට පත් කර ඇත.

එම නිසා ඉහත කාල සීමාව තුල ඊශ්‍රායල් බලධාරීන් විසින් පනවා ඇති නීති රීති සහ රෙගුලාසි මෙන්ම යහපත් සෞඛ්‍ය පුරුදුද අනුගමනය කරමින් ආරක්ෂාකාරීව සිය වාසස්ථානවල රැදී සිටින මෙන් ඔබ සියළු දෙනාටම දන්වා සිටිනු ලැබේ.

එමෙන්ම අදාළ කාලසීමාව තුළදී ශ්‍රී ලංකා තානාපති කාර්යාලයද ප්‍රජාව/පිටතින් පැමිණෙන අමුත්තන් සඳහා තාවකාලිකව වසා දැමීමට සිදුවන බැවින් ඊශ්‍රායලයේ ශ්‍රී ලංකා ප්‍රජාවේ අතිශය හදිසි අවශ්‍යතාවයන් වලට ප්‍රතිචාර දැක්වීම සඳහා පහත සඳහන් ජංගම දුරකථන අංක ක්‍රියාත්මක වන බව කාරුණිකව දැනුම් දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| කේ. පී. චන්ද්‍රතිලක මහතා<br>පරිවාර නිළධාරි | - | 058 6875764 |
| ඉන්දිකා සේනාරත්න මිය<br>රැකියා සහ සුභ සාධන අංශය | - | 055 9284399 |

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
ටෙල් අවිව්, ඊශ්‍රායලය.

27.12.2020